# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.**

## 1. සායනික මනෝවිද්‍යාඥ HM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝවිද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

සායනිකමනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ වෙනත් රජයේ ආයතනයකහෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද සමග සායනික මනෝවිද්‍යාඥයකු ලෙස සායනික පසුබිමක වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. කළමණාකරණ මට්ටමේ (MM)I ශ්‍රේණියේ තනතුරකඅවම වශයෙන් වසර 05ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමගසායනික මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

## 2. අධ්‍යක්ෂ (මූල්‍ය) HM 1-1(තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍යය / කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

   සමග

   ක්ෂේත්‍රයට අදාළව ලබාගත් මූල්‍ය/ගණකාධිකරණය/වාණිජ්‍යය/කළමනාකරණය පිළිබඳපශ්චාත් උපාධියක් හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේපිළිගත් වෘත්තිය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

   සහ

   රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

   සහ

   රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කළමණාකරණ මට්ටමේ (MM) I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත 1 සහ 2 තනතුරුවලට අදාළ අනෙකුත් කරුණු**

- **වැටුප් පරිමාණය**

  සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :

  ක.සේ.දෙ. චක්‍රලේඛ2/2016(I)-HM1-1 රු.[80,295-15X2,270-114,345]

- **වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම්සිදු කෙරේ.

- **ප්‍රතිලාභ :** මූලික වැටුපට අමතරව රජයේ චක්‍රලේඛ අනුව ජීවන වියදම් දීමනාව, වාහන/ ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනාව සමග අනෙකුත් රජයේ අනුමත දීමනා හිමිවේ. එසේම සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

## 3. භාෂා පරිවර්තක (ඉංග්‍රීසි ) - MA -4 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, ඉංග්‍රීසිවිෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධියක් සමග අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සිංහල සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් පරිවර්තන කටයුතුවල එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

භාෂා පරිවර්තනයපිළිබඳඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක වාසියක් වනු ඇත.

## 4. භාෂා පරිවර්තක - (දෙමළ ) MA -4 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, දෙමළවිෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධියක් සමග අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සිංහල සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව, දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවටත් පරිවර්තන කටයුතුවල එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

භාෂා පරිවර්තනය පිළිබඳඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක වාසියක් වනු ඇත.

**ඉහත 3සහ 4 තනතුරුවලට අදාළ අනෙකුත් කරුණු**

- **වැටුප් පරිමාණය**

  සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :

  ක.සේ.දෙ. චක්‍රලේඛ2/2016- MA 4 රු [37,970 - 10X755 - 15X930 - 5X1,135 - 65,145]

- **වයස :** අවුරුදු 23ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ප්‍රතිලාභ :** මූලික වැටුපට අමතරව රජයේ චක්‍රලේඛ අනුව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

## 5. පුස්තකාලයාධිපතිMA -3 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පුස්තකාල විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

- **වැටුප් පරිමාණය**

  සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :

  ක.සේ.දෙ. චක්‍රලේඛ2/2016 - MA 3රු.[32,200 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,960]

- **වයස :** අවුරුදු 23ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ප්‍රතිලාභ :** මූලික වැටුපට අමතරව රජයේ චක්‍රලේඛ අනුව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

## 6. තොරතුරු තාක්ෂණ සහකාර MA -2-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීමය සුදුසුකම් (NVQ)05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් (තොරතුරු තාක්ෂණය)ලබා තිබීම හා එක් වසරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

- **වැටුප් පරිමාණය**

  සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :

  ක.සේ.දෙ. චක්‍රලේඛ2/2016 - MA 2-1රු.[30,310 -10X300 -7X350 - 4X 495- 20X 660 -50,940]

- **වයසඃ** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ප්‍රතිලාභ :** මූලික වැටුපට අමතරව රජයේ චක්‍රලේඛ අනුව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

## පොදු කරුණු

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

මෙම තනතුරු සඳහා වූ ආදර්ශ අයදුම්පත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.childprotection.gov.lk වෙතින් බාගත කර ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024 මාර්තු මස 11 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය.

සියලු ම අයදුම්පත් සමග උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ද යොමු කළ යුතුය. යම් අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා අයදුම්කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කර එවිය යුතුය. රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් යොමුකළ යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත් කොට නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා ඉහත අවශ්‍යතා සම්පූර්ණ නොකරන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මෙම තනතුරු ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.කෙටි ලයිස්තුගත අයදුම්කරුවන් පමණක් ලිඛිත තරඟකාරී විභාගය හා/හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**නො.330, තලවතුගොඩ පාර, මාදිවෙල,**
**ශ්‍රී ජයවර්ධනපුර.**

**දුරකථනය :** 0112-778911-14
**වෙබ් අඩවිය :** www.childprotection.gov.lk